**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 15 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර**,** මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සොයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් සහ ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා, අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍යතත්ත්වය පිළිබඳප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂය රු.17,961,282,882 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.21,994,435,383 ක් ලෙස රු.4,033,152,501 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු වීම. | අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ ආකෘතිය තුළම කටයුතු කිරීම නිසා පරිගණක ගත කිරීමේදි මෙය අත්හැරී තිබූ බවත් ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |

**1.6.2** **වාණිජ අත්තිකාරම් ගිණුම්**

දෙපාර්තමේන්තුව විසින් අංක 28502 දරන වාණිජ අත්තිකාරම් ගිණුමේ කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ වගා හානි හා තොග හානි ලෙස රු.18,570,224 ක් ගිණුම්ගත කර තිබුණද හානි ගණනය කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | තොග හානි ගණනය කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | මෙම හානි අගය කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියේදී හෙළිදරව් කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද ආයතන 11 කට අයත් මෝටර් රථ 13 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම්වල අගය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | මෙම අත්තිකාරම් ගිණුමේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය, ක්ෂය කිරීමේ පදනම, ක්ෂය කිරීම සඳහා අදාළ කර ගත යුත්තේ කුමන වත්කම් ද යන්න තීරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් තොරතුරු විමසා ඇති අතර, ඒ අනුව, එළඹෙන අවසන් තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | බටඅත නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ තොග තක්සේරු වාර්තාව අනුවරු.45,992 ක් වූ ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.399,192 ක් ලෙසරු.353,200 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 505 අනුව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලබන බව දන්වා ඇත. |
| (ඈ) | පිදුරුතලාගල බීජ නිෂ්පාදන ගොවිපළේ තොග තක්සේරු වාර්තාව අනුව වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.1,315,140 ක් වුවද රු.135,140 ක් ලෙස රු.1,180,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 505 අනුව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලබන බව දන්වා ඇත. |
| (ඉ) | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 15 ක වටිනාකම රු.174,439,461 ක් වූ ගොඩනැගිලිවලට අදාළව ක්ෂය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ක්ෂය ගැළපීම් සිදුකළ යුතු වීම. | මෙම අත්තිකාරම් ගිණුමේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය, ක්ෂය කිරීමේ පදනම, ක්ෂය කිරීම සඳහා අදාළ කර ගත යුත්තේ කුමන වත්කම් ද යන්න තීරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් තොරතුරු විමසා ඇති අතර, ඒ අනුව, එළඹෙන අවසන් තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඊ) | සීතාඑළිය ශාඛා සංකීර්ණයේ හා ගන්නෝරුව එළවලු බීජ මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් සතොයක්ෂණ වාර්තා අනුව වර්ෂය තුළ මිළදී ගැනීම් ලෙස දක්වා නොතිබුණු එකතුව රු.7,288,412 ක් වූ කාර්යාල උපකරණ හා ලී බඩු, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්නවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල මිළදී ගැනීම් ලෙස දක්වා තිබුණු අතර එම වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.200,898 ක ක්ෂය ප්‍රතිපාදන ගලපා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතු වීම. | මුදල් රෙගුලාසි 505 අනුව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලබන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (උ) | මල්වත්ත බීජ නිෂ්පාදන ගොවිපළේ ස්ථාවර වත්කම් සත්‍යාක්ෂණ වාර්තාව අනුව ට්‍රැක්ටර් හා ට්‍රේලර් ආරම්භක ශේෂය රු.25,149,500 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.27,749,500 ක් ලෙස රු.2,600,000 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ ක්ෂය රු.130,000 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතු වීම. | මුදල් රෙගුලාසි 505 අනුව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලබන බව දන්වා ඇත. |
| (ඌ) | කඳපොල බීජ අර්තාපල් ගොවිපළ සතු 2019 දෙසැම්බර් 03 දින අත්පත් කර ගත් ලොරි රථයේ වටිනාකමද, ස්ථාවර වත්කම් සත්‍යාක්ෂණ වාර්තාවේ යන්ත්‍රෝපකරණ 47 ක වටිනාකමද කරදියනාරු ගොවිපළේ ගොඩනැගිලි 15 ක වටිනාකමද තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් හා අදාළ ක්ෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම අත්තිකාරම් ගිණුමේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය, ක්ෂය කිරීමේ පදනම, ක්ෂය කිරීම සඳහා අදාළ කර ගත යුත්තේ කුමන වත්කම් ද යන්න තීරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් තොරතුරු විමසා ඇති අතර, ඒ අනුව, එළඹෙන අවසන් තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (එ) | ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් සත්‍යාක්ෂණ වාර්තාව අනුව වර්ෂය තුළයන්ත්‍රෝපකරණ හා ආම්පන්න මිලදීගෙනනොතිබුණද මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කළ ඇමුණුම 03හිඑය පිළිවෙලින් රු.5,156,132 ක් හා රු.1,428,660 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකම්වලින් වර්ෂයේ අත්පත් කර ගැනීම් හාවර්ෂයේ ක්ෂය කිරීම් එකතුව රු.164,620 කින් වැඩියෙන්ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතු වීම. | මෙය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොවිපළ අත්තිකාරම් ගිණුමේ වත්කම් ඉවත් කිරීමේ පිරිවැය ලෙස රු.50,456,727 ක්දක්වා තිබුණද ඊට අදාළ ඉවත් කිරීම් ක්ෂය නිශ්චිතව ගණනය කිරීමට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත්කළ යුතු වීම. | මෙම අත්තිකාරම් ගිණුමේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය, ක්ෂය කිරීමේ පදනම, ක්ෂය කිරීම සඳහා අදාළ කර ගත යුත්තේ කුමන වත්කම් ද යන්න තීරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් |

| | | | |
|---|---|---|---|
| | | | තොරතුරු විමසා ඇති අතර, ඒ අනුව, එළඹෙන අවසන් තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (ආ) | ගොවිපළ නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.12,175,459 ක් වූ ණයහිමි ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය සනාථනයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. | මෙම ණය හිමි ශේෂය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් යම් යම් කටයුතු උදෙසා වර්ෂ අවසානයේ දී ලබාදුන් මුදල්ය. මෙහි තහවුරුව ලබාගත යුත්තේ ලේකම්වරයාගෙනි. ඒ සම්බන්ධයෙන් විමසීම් කළද පිළිතුරු ලැබී නොමැති බව දන්වා ඇත. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 6.1 වගන්තිය | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම රජයේ නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් වුවද සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ආයතන 02 ක නිලධාරීන් 10 දෙනෙකු වර්ෂ 05 ඉක්මවා වසර 03 සිට වසර 14 යි මාස 11 දක්වා කාලයක් රජයේ නිවාසවල අඛණ්ඩව පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. | ආයතනසංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරවකට යුතු කළ යුතු වීම. | නියමිත කාලයට වඩා වැඩි කාලසීමාවක් පදිංචි වී සිටින නිලධාරීන් ඉවත්කර පොරොත්තු ලේඛනයේ සිටින අනෙකුත් නිලධාරීන්ට නිවාස ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 104(4) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට හා ඊට අයත් ප්‍රාදේශීය ඒකකවලට අදාළ අවස්ථා 90 කදී සිදු වී තිබුණු එකතුව රු.11,994,367 ක් වූ හානි හා පාඩු සම්බන්ධයෙන් වසර 1 සිට වසර 28 දක්වා කාලයක් ගතවී තිබුණද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අවස්ථා 90 කදී සිදු වූ හානි පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 175(2) හා 1993 ජූලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය | ගොවිපළ අත්තිකාරම් ගිණුමට අදාළව වසර 01 සිට වසර 07 දක්වා කාලයක් ගත වී තිබුණද එකතුව රු.14,667,199 ක ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමටත්, එම ආදායම එකතුකර ගැනීමටත් කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (iii) මුදල් රෙගුලාසි 177 | දෛනික ලැබීම් දිනපතා බැංකුගත කළ යුතු වුවද ආයතන 04 ක් දෛනික ලැබීම් දින 2 සිට දින 11 දක්වා කාල ප්‍රමාදයකින් පසුව බැංකුගත කර තිබුණි. | මුදල් රෙගුලාසිප්‍ර කාරවකට යුතු කළ යුතු වීම. | ඉදිරියේදී මුදල් බැංකුගත කිරීමේ කටයුතුවඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

(ඇ) **කෘෂිකර්ම අමාත්‍යාංශ චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2003 මැයි 12 දිනැති අංක 01/2003 දරන කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | රජයේ නිවාස සඳහා දිගින් දිගටම ආර්ථික කුලිය අය කර ගැනීම සිදු නොකළ යුතුය. අදාළ රජයේ නිවාස අළුත්වැඩියා කිරීමටත් එසේ පිළිසකර කිරීමෙන් පසුව නිවාස කුලිය ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.2 හා 5.4 වගන්ති අනුව නිශ්චය කර | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම රජයේ නිවාස සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ලැබීමෙන් පසු ඒ අනුව කුලී අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

කුලිය අය කර ගැනීමටත් කළ යුතු වේ. කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලය සතු රජයේ නිවාස 61 ක් සඳහා වර්ෂ10 කට වැඩි කාලයක සිට දිගින් දිගටම ආර්ථික කුලිය අය කර තිබුණද වාර්ෂිකව තක්සේරු වාර්තා ලබා ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ක්‍රියාකාරකම් ඵලදායීව පාලනය කර ගැනීම සඳහා මාසිකව දෙපාර්තමේන්තුවට අවශ්‍ය අක්මුදල් ප්‍රමාණය සැලැසුම් කර ඒ අනුව අවශ්‍ය අග්‍රිම ප්‍රමාණය ඉල්ලුම් කළ යුතු වුවද, මාසික අග්‍රිම සැලැස්ම ඉක්මවා මාස 07 ක් අග්‍රිම වැඩියෙන් ඉල්ලුම් කර තිබුණි. | අග්‍රිමඅවශ්‍යතාවය නිවැරදිව සැලැසුම් කළ යුතු වීම. | වර්ෂය ආරම්භයේ සැලසුම් කල ආකාරයට භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා දෙන්නේ නම් ඵලදායි මූල්‍ය පාලනයක් සිදු කර ගත හැකි බව සහ සැලැසුම් කළ ප්‍රමාණයට වඩා අක්මුදල් ඉල්ලා ඇති බවත් දන්වා ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, වැය විෂයන් 15 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් එකතුව රු.88,256,273 ක් හෙවත් සියයට 4 ක් වෙනත් වැය විෂයන් වෙත මාරු කර තිබුණි. වැය විෂයන් අතර එලෙස මාරු කිරිමේ ප්‍රතිශතය සියයට 1 ත් සියයට 80 ත්අතර පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. | පුද්ගල පඩිනඩි ගෙවිමට, ඩොලරයේ වටිනාකම ඉහල යාම නිසා ලිපි ද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2018 අනුව සංයුක්ත දිමනා ගෙවිමට සිදුවිම හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2014 , 03/2014 (1) අනුව රජයේ නිලධාරීන්ට සන්නිවේදන පහසුකම් සැපයීමට සිදුවිම නිසා මෙම ප්‍රතිපාදන මාරු කිරිමට සිදු වූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 ජූනි 17 දිනැති අංක 04/2019 හා 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව විදුලිය හා විදුලි පරිභෝජනය, දුරකථන සේවා, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ දේශීය හා විදේශීය ගමන් වියදම් මනා පාලනයකින් යුතුව පවත්වා ගැනීමට හැකි වන පරිදි නිර්ණායක සකස් කර ක්‍රියාත්මක කිරීමට සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වගබලා ගත යුතු විය. එහෙත් අදාළ වැය විෂයන්හි, ඉකුත් වර්ෂයේ එකතුව රු.153,267,003 ක් වූ වියදමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු.167,707,521 ක් වූයෙන් රු.14,440,518 ක් හෙවත් සියයට 9 ක් වැඩිපුර වියදම් දරා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඩොලරයේ අගය වැඩිවීම නිසා සියළුම ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ වල මිල ගණන් වැඩිවීම, ඉන්ධන දීමනා සඳහා හිමිකම් පාන නිලධාරීන් වැඩිවීම හා අනපේක්ෂිත ලෙස මුහුණ දුන් සේනා දළඹුවා වසංගතය නිසා ක්ෂේත්‍ර රාජකාරි වැඩිවීම මෙම වියදම් ඉහළ යාමට හේතු වී ඇති බව දන්වා ඇත. |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් 27 ක එකතුව රු.226,234,559 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.32,977,959 ක් හෙවත් සියයට 15 ක් ඉතිරි කර තිබුණි. එම ඉතිරිය සියයට 6 ත් සියයට 74 ත් අතර පරාසයක පැවතුණි. | නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. | මෙහිදි මෙම වැය විෂයන් යටතේ ලැබෙන ප්‍රතිපාදනයන් අධ්‍යක්ෂ ඒකක වෙත වෙන් කිරීමේදි ඉතාම සුළු මුදලක් වෙන් කිරීමට සිදුවේ. මෙහිදි දැරීමට අවශ්‍ය වියදම් තිබුණද පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා බැදීම් වලට යාමට නොහැකි නිසා වර්ෂය අවසානයේ ඉතිරි වී ඇති බව දන්වා ඇත. |
| (ඇ) | 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව මූලධන වියදම් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් පිළිවෙළින් සියයට 15 ක් හා සියයට 10 ක් ලෙස සියයට 25 ක් ඉතිරි කර ගත යුතු විය.එසේ වුවද මූලධන වැය විෂයයන් 44 ක රු.1,723,810,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.640,458,943 ක් හෙවත් සියයට 37 ක් ඉතිරි කර තිබුණි. නමුත් වැය විෂයයන් 10 ක එම සියයට 25 ට අමතරව තව දුරටත් සියයට 3 සිට සියයට 75 දක්වා ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි. තවද මූලධන වැය විෂයන් 36 ක්සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව සියයට 25 ක් ඉතිරි කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූලධන ප්‍රතිපාදන පවරා ගන්නා ලෙස අමාත්‍යාංශය හරහා අයවැය දෙපාර්තමේන්තුවට දන්වා තිබුණද එම ප්‍රතිපාදන පවරා ගෙන නොතිබූ අතර එබැවින්, මෙම අවිනිශ්චිතතාවය මත හා අක්මුදල් ප්‍රමාණවත් නොවීම මත මෙම ප්‍රතිපාදනය ඉතිරි වි ඇති බව දන්වා ඇත. |

**2.3** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූලධන වැය විෂයන් 2 ක් සම්බන්ධයෙන් ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු.583,143 ක බැරකම්වලට එළඹ තිබුණි. | ප්‍රතිපාදනය ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතු වීම. | බැරකම් ලෙස ඉක්මවා ඇති ඉහත වැය විෂයන් යටතේ වන ගෙවීම් වටිනාකම් 2020 වර්ෂයේ නියමිත ප්‍රතිපාදන මඟින් ගෙවීම් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

**2.4** **අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට වර්ෂ 01 සිට වර්ෂ 25 දක්වා කාල පරාසයක් ගත වී තිබූ ණයගැති ශේෂවල එකතුව රු.7,286,808 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලබාදුන් ණය නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම් 05 කට අදාළව වසර 18 ත් වසර 28 ත් අතර කාලයක් ඉක්ම වූ අනුමත නොකළ සමුච්චිත කාරක පාඩුවල එකතුව රු.67,146,096 ක් විය. | මුදල් රෙගුලාසි 513 හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 132අ(3) හා (4) නියෝග අනුව කටයුතු කළ යුතු වීම. | මෙම ඇවර කළ අත්තිකාරම් ගිණුම් සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට කඩිනමින් කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) විෂය අංක 285-05 දරන සහතික කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය අත්තිකාරම් කාර්යයඇවර කිරීමේ අත්තිකාරම් ගිණුමට අදාළ වර්ෂ 28 ක් ඉක්මවා තිබුණු පියවිය යුතු ශේෂය රු.76,157 ක් විය. | මුදල් රෙගුලාසි 518 අනුව කටයුතු කළ යුතු වීම. | මෙම ඇවර කල අත්තිකාරම් ගිණුම් සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට කඩිනමින් කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කල්පිත ගාස්තු ගැලපීමෙන් පසුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,159,141 කින් පිරිහී තිබුණි. | ලාභය උපරිම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පැවති අයහපත් කාලගුණික තත්ත්වය, යෙදවුම් මිල ඉහල යාම හා අලෙවි මිලෙහි සංශෝධනයක් සිදු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇති බව දන්වා ඇත. |
| (ආ) කරදියනාරු ගොවිපළෙහි පසුගිය කන්න 05 ක ඉලක්ක ගත මුළු බීජ වී නිෂ්පාදනය බුසල් 50620 ක් වුවද නිපද වූ ප්‍රමාණය බුසල් 23909 ක් එනම් සියයට 47.23 ක් විය. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ප්‍රදේශයේ මහ කන්නයේ දී පවතින අධික වර්ෂාව හා යල කන්නයේ දී පවතින ජල හිඟය කුඹුරු අස්වැන්නට බලපෑම් ඇති කළ බව දන්වා ඇත. |
| (ඇ) කන්තලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදු කරන ලද කොන්ත්‍රාත් බීජ වී නිෂ්පාදනය කිරීමේ වැඩසටහන යටතේ පසුගිය කන්න 07 ක කොන්ත්‍රාත් බීජ නිෂ්පාදනය කිරීම සඳහා ලබා දුන් බුසල් 24500 ක ඉලක්කයෙන් ළඟා කර ගත් මට්ටම බුසල් 11484 ක් එනම් සියයට 46.87 ක් විය. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වාර්ෂිකව සමහර බීජ ප්‍රභේද සඳහා ඇතිවන ඉල්ලුම අඩුවීම හේතුවෙන්, කන්නය තුළ බීජ මිළදී ගැනීම රජයට අවාසිදායක යැයි හැඟේ නම් එම මිලදීගැනීම් සීමා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඈ) 2018 යල කන්නය සඳහා වූ එළවළු බීජ නිෂ්පාදනය කිරීමේ භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව අනුව අඹේපුස්ස එළවළු බීජ නිෂ්පාදන ගොවිපළේ හෙක්ටයාර් 5.75 කට අදාළ අපේක්ෂිත බීජ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 1,693 ක් වුවද, ළඟා කර ගත හැකි වූ බීජ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 470.1 ක් එනම් සියයට 27.7 ක් වැනි අවම මට්ටමක පැවතුනි. එසේම නිෂ්පාදනය කරන ලද බෝග වර්ග 18 කින් බෝග වර්ග 15 ක්ම අපේක්ෂිත බීජ ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වීම සියයට 51 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුනි. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමටකටයුතු කළ යුතු වීම. | ඒ සඳහා බලපා ඇති ප්‍රධාන හේතුව වී ඇත්තේ 2018 යල කන්නයේ එලවළු හා අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනයට අදාළව හෙක්ටයාර 5.4 ක ප්‍රමාණයක් සඳහා බෝග ප්‍රභේද 18 ක ඉලක්කයන් ලැබීමයි. තවද ඇතැම් බෝග සඳහා අභිජනන බීජ, මූලික බීජ තොග නොමැති හා නියං තත්ත්වය යනාදිය හේතු වූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වල්පිට ගොවිපළේ 2011 වර්ෂයේ සිට 2019 ජූලි දක්වා කාල පරාසය තුළ යෙදවුම් ලෙස භාවිතා කරන ලද ඒකක 292656 ක් වූ අඹ, දූරියන් හා අලිපේර බීජ මඟින් බද්ධ කළ පැළ ප්‍රමාණය 150980 ක් විය. ඉන් සාර්ථක වූ පැළ ප්‍රමාණය 40956 ක් විය. එය මුළු බීජ යෙදවුම්වලින් ප්‍රතිශතයක් ලෙස සියයට14 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි. | නිමවුම වර්ධනය කරගැනීම සඳහා කටයුතු කළයුතු වීම. | දැනට තවානේ එක් බද්ධකරුවකු පමණක් සිටින අතර එම අඩුව පිරිමසා ගැනීම සඳහා තවානේ වූ කම්කරුවන් ද පුහුණු කර බද්ධ පැළ නිෂ්පාදනයට යොදවා ගනී. එබැවින් ඔවුන්ගේ බද්ධ පැළ සාර්ථක වීමේ ප්‍රවණතාවය පුහුණු බද්ධකරුවන්ගේ තත්වයට වඩා අඩුය. එමෙන් ම පසුගිය මාස 6 තුළ පැවති අඛණ්ඩ වර්ෂාව හා අධික වියළි කාලගුණ තත්ත්වය යටතේ ද බද්ධය සාර්ථක වීමේ ප්‍රතිශතය අඩු වී ඇති බව දන්වා ඇත. |
| (ඊ) | KOPIA බිම්මල් ව්‍යාපෘතිය යටතේ බිම්මල් වගා ඒකකයක් සහ බිම්මල් බීජ නිෂ්පාදනාගාරයක් 2014 අප්‍රේල් මස 04 දින පස්යාල උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපළේ ආරම්භ කර පවත්වාගෙන ගොස් තිබුණද, විගණන දිනය වූ 2019 ජූලි 17 දින වන විට එම ඒකකය අපේක්ෂිත අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සම්පත් යෙදවීමට කටයුතු කළ යුතු වීම. | ගොවිපළේ පවත්වාගෙන යන ලද බිම්මල් ඒකකයේ නිෂ්පාදන කටයුතු දැනට සිදුනොවන බව දන්වා ඇත. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ බීජ සංරක්ෂණ අංශයේ ජාන බැංකුව අළුත්වැඩියා කිරීම සඳහා රු.44,548,357 ක ව්‍යාපෘතියකට2019 අගෝස්තු 28 දින ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව 2020 මාර්තු 30 දිනට පෙර අවසන් කළ යුතු වුවද කොන්ත්‍රාත්කරු විසින් දින 60 ක ප්‍රමාදයකින් පසු ආරම්භ කර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම අළුත්වැඩියා කටයුතු මුළුමනින්ම ආනයනය කරන යන්ත්‍ර සහ උපකරණ මත රඳා පවතින බැවින්, මෙම ප්‍රමාදය සිදු වී ඇති බව දන්වා ඇත. |
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කළ යුතු වටිනාකම රු.61,257,998 ක් වූ කොන්ත්‍රාත් 16 ක ඉදිකිරීම් කටයුතු 2020 අගෝස්තු 13 වන දිනය වන විටද අවසන් කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | කොරෝනා වසංගතය පැවතීම හේතුවෙන් වැඩ බිම් සියල්ල සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට අපහසුව පැවති අතර සීමිත සේවක පිරිසක් යොදාගෙන ආරක්ෂිත ක්‍රම |

| | | | |
|---|---|---|---|
| | | | අනුගමනය කරමින් කටයුතු කිරීමට වූයෙන් වැඩ මන්දගාමීව සිදු විය. ඉදිරි සති තුළ වැඩ අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | කුණ්ඩසාල බීජ නිෂ්පාදන ගොවිපළේ ජල නළ පද්ධතිය ස්ථාපිත කිරීම කටයුත්ත ගිවිසුම් ප්‍රකාරව 2018 ජූලි 06 වන දින සිට දින 90ක් ඇතුළත එනම්2018 ඔක්තෝබර් 06 දිනහෝ ඊට පෙර ඉටු කළ යුතු වුවද , 2020 ජුනි 06 වන දින වන විටත් නිම කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී හඳුනා ගත් අඩු පාඩු නිවැරදි කිරීම සඳහා දිගින් දිගටම උත්සාහ ගත් අතර මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණ වූ ගොවිපල වෙත වාරි ජලය ලබා දීමේ කටයුත්ත මෙම පද්ධතිය භාවිතා කරමින් සිදු කරන බව දන්වා ඇත. |

**3.3 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ඉංජිනේරු අංශය මඟින් ක්‍රියාවට නංවන ලද කොන්ත්‍රාත් වටිනාකම රු.57,023,295 වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 20 ක ඉදිකිරිම් කටයුතු ආරම්භ කළ යුතු නියමිත දිනට ආරම්භ කිරීමකින් තොරව කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කර තිබුණි. | ඉදිකිරිම් කටයුතු නියමිත දිනට ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වීම. | එම කාලවකවානුව තුළ පැවති අධික වර්ෂාව හේතුවෙන් නියමිත දිනට වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී ඇති බව දන්වා ඇත. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2020 ජූලි 25 දින වන විටද එසේ සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ආකෘති පත්‍ර ලැබීම ප්‍රමාද වීම, කෝවිඩ් - 19 වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීමට සිදුවීම, තිරසර සංවර්ධන දර්ශක සැකසීම ප්‍රමාද වීම,විගණන වාර්තාව ලැබීම ප්‍රමාද වීම හා දෙමළ භාෂා පරිවර්තකයෙකු නොසිටීම හේතුවෙන් ප්‍රමාද වී ඇති බව දන්වා ඇත. |

**3.5 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ බීජ සංරක්ෂණ අංශයේ ජාන බැංකුව අළුත්වැඩියා කිරීමට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවෙහි අයිතම 03 ක් යටතේ මිල ගණන් කැඳවා තිබූ අතර එහි පළමු අයිතමයේ ඇස්තමේන්තු වටිනාකම රු.32,200,000 ක් විය. ඒ සඳහා ලංසුකරුවන් තිදෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව වටිනාකම රු.44,548,357 ක්වූ තෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු වෙත ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමට වඩා රු.12,348,357 ක් එනම් සියයට 38.20 ක් වැඩියෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | සම්පූර්ණවූත් නිවැරදිවූත් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරිපත් වී ඇති මිල ගණන් වෙළඳපල මිල ගණන් හා සාධාරණ බව පැහැදිළි වේ.මෙය තවදුරටත් අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් මෙම ස්ථානයට හානි සිදුවීමෙන් මේවන තෙක් සුරක්ෂිත කර ඇති පැළෑටි ජාන විනාශ විය හැකිය. එබැවින්, මෙම අලුත්වැඩියාවන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව කඩිනමින් සිදුකළ යුතු කටයුත්තකි. එබැවින්, ඉහත දක්වා ඇති කරුණු සැළකිල්ලට ගෙන මෙම කාර්යය සාර්ථක ලංසුකරුවෙකු වෙත ප්‍රදානය කිරීමට තීරණය කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ බීජ සංරක්ෂණ අංශයේ ජාන බැංකුව අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව ඇස්තමේන්තුව රු.මිලියන 56.22 ක වටිනාකමකට 2018 ජනවාරි මස පිළියෙල කර තිබුණි. එම ඇස්තමේන්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3. මාර්ගෝපදේශය අනුව උද්ධමනය සහ අනෙකුත් කරුණු සැළකිල්ලට ගෙන යාවත්කාලීන නොකර 2019 වර්ෂයේ මැයි මස නැවත ලංසු කැඳවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මෙවැනි අයිතමයන් සඳහා සම්මත මිල ගණන් නොමැතිවීම හේතුවෙන් වෙළඳපොල මිල ගණන් සලකා ඇස්තමේන්තු සකස් කිරීමට නොහැකි බැවින් ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී ඉතා විශාල සංශෝධනයක් කල නොහැකි විය.කෙසේ වෙතත්, 2018 වසරේ මුල් පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 40.5 වන අතර, 2019 වසරේදී එය රු.මිලියන 56.22 ක් ලෙස සංශෝධනය කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) මාර්ගෝපදේශය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව |

| | | | |
|---|---|---|---|
| | අනුව රු.408,255 ක් වූකරදියනාරු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදිරිපිට ප්‍රධාන ගේට්ටුව සහ නාම පුවරුවක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද මේ සඳහා මඩකලපු දිස්ත්‍රික්කයට අදාළ මිල ගණන් (BSR) භාවිතා කළ යුතු වුවදඑසේ සිදු කර නොතිබුණි. | සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | කරදියනාරු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් වටිනාකම රු.595,400 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් ප්‍රදානය කර තිබුණද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 මාර්ගෝපදේශය අනුව එම කමිටුව සඳහා ඉදිකිරීම් විෂය පිළිබඳ විශේෂඥයකු සහභාගී වී නොතිබූ අතර තාක්ෂණික ඇගැයිම් කමිටුවක් පත්කර ඔවුන්ගේ නිර්දේශ ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත්කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7 වගන්තිය ප්‍රකාරව කටයුතු විධිමත්ව සිදුකිරීමට විධිවිධාන සලස්වා ගන්නා ලෙසත්, ඉදිරියේදී ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, ප්‍රසම්පාදන අත්පොත හා ඊට අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙසත් දන්වා ඇත. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශය අනුව යහපත් කෘෂි පිළිවෙත් (GAP) ව්‍යාපෘතිය යටතේ නාම පුවරු 15 ක් සපයා සවි කිරීම සඳහා ප්‍රදානය කර තිබූ වටිනාකම රු.4,251,350 ක් වූ කොන්ත්‍රාත්තුවට අදාළව ලංසු කැඳවීමේ කොන්දේසි ඉතා කෙටි සහ පැහැදිලි පිරිවිතරයන් කෙටුම්පත් කර නොතිබුණි.එම හේතුවෙන් ඉදිරිපත් වූ ලංසු 04 න් අවම මිල ඉදිරිපත් කළ මුල් ලංසුකරුවන් දෙදෙනාම ප්‍රතික්ෂේප කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මෙම කොන්ත්‍රාත්තුවට අදාළව ලංසුකරුවන්ගේ මූල්‍යමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල මෙන් දස ගුණයක ආදායමක් තිබිය යුතු බව ලංසුකරුවන්ගේ කොන්දේසි ලෙස සඳහන් කරන ලද බව දන්වා ඇත. |
| (ඊ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුං වගා ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු.4,000,000 ක් වූ වර්ණ විභේදක යන්ත්‍රයක්, රු.7,960,000 ක් වැය කර මිලදී ගෙන තිබූ කොන්ත්‍රාත්තුවට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 සහ 4.3.2 මාර්ගෝපදේශ අනුව සියළු සම්බන්ධිත පිරිවැය (TCE) ඇතුළත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. මෙහිදී | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා පිරිවිතර සඳහන් කිරීමේදී මෙම යන්ත්‍රය සපයා, සවිකර, විදුලි සම්බන්ධතාවය ලබා දීමද සැපයුම්කරු විසින් කළයුතු බවසඳහන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු පිරිවැය සියයට 99 ක් ඉක්මවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | | |
| (උ) | වල්පිට ගොවිපළ කළමනාකරු විසින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ආවරණ ලිපි (Letter Head) යොදා ව්‍යාජ ලෙස මිල ගණන් ඇතුළත් කරමින් වටිනාකම රු.302,200 ක් වූ තවාන් උපකරණ මිලදි ගැනීම සිදුකර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මේ වනවිට අදාළ මූලික විමර්ශනය පවත්වා අවසන්ව වාර්තාව ලැබී ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. |
| (ඌ) | වල්පිට ගොවිපළේ සේවයකරන මුරකරුවන්ගේ භාර්යාවන්ව්‍යාජ සැපයුම්කරුවන් ලෙස යොදාගනිමින් දුර්වල ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර බීජ වර්ග, ගොම පොහොර සහ වැලි මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.4,344,075 ක මුදලක් ගෙවා තිබුණි.මේ අනුව ගොවිපළේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ඉතා දුර්වල තත්ත්වයකපැවතුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මේ වනවිට අදාළ මූලික විමර්ශනය පවත්වා අවසන්ව වාර්තාව ලැබී ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. |
| (එ) | කුණ්ඩසාල රජයේ බීජ නිෂ්පාදන ගොවිපළට ජලය සැපයීම සඳහා නව ජල පොම්පාගාර පද්ධතියක් ඉදි කිරීමට රු.9,962,000 ක (VAT රහිත) වටිනාකමකට 2018 අගෝස්තු 09 වන දින කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ)හා(ආ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කර නොතිබුණි. 8.13.4 මාර්ගෝපදේශය අනුව සියයට 5 ක ප්‍රමාණ බිල්පත් වැටයීමක් සහ සියයට 10 ක මිල විචලනයකට සීමා විය යුතු වුවද ඇස්තමේන්තු වටිනාකමට වඩා රු.2,889,500 ක් එනම් සියයට 40.85 ක් වැඩියෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. 7.9.2 මර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්තුවේ ඇස්මේන්තු වටිනාකම (Sub Total) හා ලංසු වටිනාකම විචලනය සීයයට 30 සිට සියයට 520 දක්වා පරාසයක පැවතුණද ඊටහේතු විශ්ලේෂණය කර නොතිබුණි.තවද 5.4.8 මාර්ගෝපදේශයට අනුව වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනයෙන් දින 28 ක් ඔබ්බට ලබා ගත යුතු වුවද දින 90 ක් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොමැතිව ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.<br>inline booster pump ය සවිකිරීමේ ස්ථානය වෙනස් කිරීමට සිදුවීම නිසා අමතර කාර්යය සඳහා මුදල රු.791,875 ක් වන අතර, එය මුල් පිරිවැය ඇස්තමේන්තු වටිනාකමින් සියයට 8.77 කි.ලංසු කැඳවීමේදි සවිස්තරාත්මක මිල විස්තරයක් ඉල්ලීමට අපොහොසත් වීමේ දෝෂය හේතුකොට ගෙන විමසුමේ පෙන්වා දී ඇති එක් එක් අයිතම වල අධික මිල විචල්‍යය තාක්ෂණික ඇගයීමේදි සලකා බැලිමට අපොහොසත් වි ඇත. සමස්ථ වටිනාකම සලකා බැලීමෙන් අනතුරුව පමණක් තාක්ෂණික ඇගයුමේ තීරණය ලබා දී ඇත.කාර්යය සාධන සුරක්ෂණය 2019 මැයි 21 දින දක්වා ලබාගෙන ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | වලංගු වන පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන තිබුණි. | | |
| (ඒ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 අනුව ලංසු සුරක්ෂණයන් ලබාගත යුතු වුවද එකතුව රු.159,622,609 ක් වූ කොන්ත්‍රාත් 90 කට අදාළ වටිනාකම රු.2,235,750 ක ලංසු සුරක්ෂණ නියමිත දින ගණනට වඩා දින 02 සිට දින 65 ක් දක්වා වැඩි කාලයක් සඳහා වලංගුව ලබා ගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | මෙහිදී ලංසු සුරක්ෂණයේ කාලයට වඩා දින 28 ක් වැඩිකර ලංසු සුරක්ෂණයේ වලංගු කාලය තීරණය කර ඇත. ලංසු විවෘත කිරීමෙන් පසුව ඇගැයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන මණ්ඩලයේ කාර්යක්ෂමතාවය මත ගිවිසුම් ප්‍රදානය කිරීමේ කාලය තීරණය කරනු ලැබේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:3:10 , 5:3:11 හා SPD-3 අනුව, ඒ ඒ කාර්යයන් සඳහා දින නියමකර ඇති බව දන්වා ඇත. |
| (ඔ) | පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් බීජ සැකසීමේදී, වියළීමේදී හා ඇසිරීමේදී වායුගෝලීය තෙතමනය පවත්වා ගෙන යාම සඳහා භාවිතා කරනු ලබනDehumidifierයන්ත්‍ර 08 ක් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කළද සුදුසු ලංසුකරුවන් තෝරා ගැනීමට නොහැකි වීම මත 2019 ජූලි 24 දින ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත ප්‍රසම්පාදනය කළ යුතු බව දක්වා තිබුණි. නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන පිරිවිතර සකස් කර ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනයට කටයුතු කළ යුතු වීම. | අළුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ලංසුවේ මිළ ගණන් අළුතින් මිළදී ගැනීමට යන වියදම හා සැසඳීමේදී ඉහළ අගයක් ගන්නා බව නිරීක්ෂණය වීම හේතුවෙන් හා ප්‍රතිපාදන මත ඇතිවූ ගැටළු හේතුවෙන් ලංසුකරුවන් බැහැර කිරීමට සිදුවිය. එම යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට ඇති විභවය පරීක්ෂා කිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ Agri Business Centreවෙත භාරදී ඇති බව දන්වා ඇත. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම් පිලිබද කාර්ය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයිති ඉඩම් කොටස් මැනීම් කටයුතු සිදු කර විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවද, සිදු කරන ලද නියැදි පරීක්ෂාව අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන 11 කට අයත් හෙක්ටයාර් 592.62ක | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අයිතිය පැවරීමට අදාළ කටයුතු සිදු කරගෙන යන බව දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | වපසරියකින් යුත් භූමි ප්‍රමාණයක් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව ආයතන 8කට අයත් වටිනාකම ආසන්න වශයෙන් රු.10,820,000 වු ට්‍රැක්ටර් රථ 13 ක්, මෝටර් රථ 5 ක් හා යතුරුපැදි 9 ක් වර්ෂ 02 ත් 20 ත් අතර කාලයක්නිෂ්කාර්යව කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | ආයතනය සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ට්‍රැක්ටර් රථ, යතුරුපැදි හා මෝටර් රථ අළුත්වැඩියා කර භාවිතා කිරීමට, අපහරණය කිරීමට හෝ අවශ්‍යතාවය පවතින වෙනත් ඒකකයන්ට මාරු කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව ආයතන 5 කට අයත් වටිනාකම රු.11,498,859 ක් වු යන්ත්‍රසූත්‍ර 17 ක් හා ගබඩා ද්‍රව්‍ය අයිතම 26 ක් වසර 2 ත් 18 ත් අතර කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයකින් යුක්තව භාවිතා කළ යුතු වීම හා අවශ්‍යතාවයන් නිවැරදිව හදුනාගෙන මිලදී ගැනීම සිදු කළ යුතු වීම. | මෙහි ඇතැම් ද්‍රව්‍ය භාවිතයට ගනු ලබන අතර ඇතැම් ද්‍රව්‍ය භාවිතයට ගැනීමට කටයුතු කරමින් පවතී.අවශ්‍යතාවය පවතින වෙනත් ස්ථානයකට ලබාදීමට හෝ මෙම යන්ත්‍ර අපහරණය කිරීමට හෝ තාක්ෂණික ඉගෙනුම් ආයතන වෙත ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඈ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව ආයතන දෙකක පැවති මෝටර් රථ 2 ක් 2020 ජනවාරි 17 දින වන විටත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ලියාපදිංචි කර නොතිබුණි. | වෙනත් ආයතන සතු වත්කම් විධිමත්ව පවරාගෙන පරිහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | අංක 57-0527 දරන කැබ් රථයේ අයිතිය පවරා ගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. |
| (ඉ) | ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ ශීත ගබඩාවේ සාමාන්‍ය ධාරිතාවය කි.ග්‍රෑ. 30000 ක් වුවද දැනට එහි කි.ග්‍රෑ. 45000 පමණ අධි ධාරිතාවයක් සහිතව ගබඩා කර ඇති අතර මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර නව ශීතාගාර පද්ධතියක් ඉදිකිරීම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු කර නොතිබුණි. | නව ශීතාගාර පද්ධතියක් ඉදිකිරීමට කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂයේ දී ලැබෙන ප්‍රතිපාදන සැළකිල්ලට ගනිමින් නව ශීතාගාර පද්ධතියක් සකස් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඊ) | 2000 දෙසැම්බර් 14 දින පෞද්ගලික ආයතනයකින් රු.1,096,875 කට මිලදී ගන්නා ලද Hersonberවර්ගයේබීජ පැකට් කිරීමේ යන්ත්‍රය ක්‍රියා කිරීමේදී බීජවල වියළීම ඉහළ අගයක් ගන්නා නිසා මිලදී ගත් දින සිට මාස 07 කින් පසු භාවිතයෙන් ඉවත් කර තිබුණි. | ආයතනය සතු වත්කම් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව වත්කම් භාවිතා කළ යුතු වීම. | බීජ පැකට් කිරීමේ යන්ත්‍රය පිළිබඳව තාක්ෂණික වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධ වගකීම නිශ්චය කිරීම සඳහා මු.රෙ. 104 (4) නව පරීක්ෂණ කමිටුවක් 2019 මාර්තු 21 දින පත්කර ඇති අතර රටේ පැවති covid-19 වසංගත තත්වය හේතුවෙන් මෙම පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | | | නොහැකි වී ඇති බව දන්වා ඇත. |
| (උ) | කරදියනාරු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 74.4 කට ආසන්න ප්‍රදේශයක් එනම් මුළු භූමි භාගයෙන් සියයට 36.5 ක් අනවසර පදිංචිකරුවන් භුක්ති විඳිනු ලබන අතර අවස්ථා 02 කදී පලතුරු සංවර්ධන ආයතනයට අයත් භූමියෙහි අනවසර පදිංචිකරුවන් නිවාස 02 ක් ඉදිකර තිබුණි. | අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතුකළ යුතු වීම. | අදාළ ඉඩම මැන අයිතිය පවරා ගැනීමේ කටයුතු සඳහා මේ වන විට මඩකලපුව ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ සම්බන්ධ වී ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා ඇත. |
| (ඌ) | කරදියනාරු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 60.4 කට ආසන්න භූමි ප්‍රදේශයක සංවර්ධනය නොකළ වන ගහනයෙන් යුත් කඳුකර ප්‍රදේශයක් විය. ජල සැපයුම, ශ්‍රම සැපයුම සහ අනෙකුත් පහසුකම් ලබාදීමතුළින් මෙම භූමි ප්‍රදේශය වගා කටයුතු සඳහා යොදා ගත හැකිවතිබුණි. | ආයතනය සතු වත්කම් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතු වීම. | සංවර්ධනය නොකල භූමි ප්‍රදේශය වගා කටයුතු සඳහා යොදාගැනීමට පවතින හැකියාව පිළිබඳව සොයාබලා, පවතින සම්පත් උපරිම අයුරින් උපයෝජනය කරගැනීමට විධිවිධාන සලස්වා ගන්නා බව දන්වා ඇත. |
| (එ) | කන්තලේ බීජ නිෂ්පාදන ගොවිපළෙහි පොහොර ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගබඩාවක් නොමැති අතර පොහොර ගබඩා කිරීම සඳහා 1974 වර්ෂයේ ඉදි කරන ලද වපසරිය වර්ග අඩි 1085 (35x31) වූ ගොඩනැඟිල්ල 2016 වර්ෂයේ සිට වහලය අළුත්වැඩියා කළ යුතු බැවින් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. | ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීමට කටයුතු කළ යුතු වීම. | ලැබෙන ප්‍රතිපාදන අනුව නව පොහොර ගබඩාවක් ඉදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඒ) | අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපළේ සමස්ථ වපසරිය හෙක්ටයාර 60 ක් වන අතර එම ගොවිපලේ මූලික කාර්යභාරය වූ බීජ නිෂ්පාදනය සඳහා හෙක්ටයාර 12 ක් එනම් සමස්ථ භූමි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණක් යොදා ගෙන තිබුණි. | ආයතනය සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතු වීම. | ගොවිපළේ පවතින භෞතික සම්පත්, මානව සම්පත් හා පවතින ජල සම්පාදන පහසුකම් ඇතුළු අනෙකුත් සම්පත් වල ස්වභාවය අනුව අදාළ භූමි ප්‍රමාණයට බීජ නිෂ්පාදන වැඩසටහන සීමා කිරීමට සිදුවී ඇත. ඉදිරියේදී ලැබෙන සම්පත් උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා ගෙන ඇති බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටි භූමියට අයත් පර්චස් 85 ක භූමි ප්‍රමාණයේ 1976 වර්ෂයේ සිට වර්ෂ 43 ක් පුරාවට අනවසරව පදිංචිකරුවන් 20 දෙනෙකු සඳහා 2010 දෙසැම්බර් 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත්වීමේ නියෝග නිකුත් කර ඇතත් මේ වන තෙක් එම පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවටඅයිති සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | බණ්ඩාරවෙළ ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පුනාගල ඉඩමේ අනවසර පදිංචිකරුවන් යැයි පවසන පිරිසක් පදිංචිව සිට ඇති අතර, එම කොටස නිශ්චිතව අප දෙපාර්තමේන්තුවට අයත් කොටසක් ද යන්න මෙතෙක් තහවුරු කරගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව එම ඉඩම මැන තහවුරු කරගැනීමට මේ වන විට බදුල්ල දිස්ත්‍රික් මිනුම්දෝරු කාර්යාලය වෙත දන්වා ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත. |
| (ඕ) | වැසි ජලයට ඔරොත්තු නොදෙන බද්ධ පලතුරු පැළ දැඩි කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.795,000 ක වියදමක් දරා පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි වැසි ආවරණ ගෘහයක් ඉදිකර තිබුණද එහි පොලිතීන් ආවරණය 2020 ජනවාරි 24 දින වන විට භාවිතයට ගත නොහැකි අන්දමට දිරා ගොස් තිබුණි. | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රතිපාදන ලද විගස අදාළ කාර්යය කඩිනමින් නිම කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ක) | කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලය සතුවිජේරාම නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු 2016, 2017 සහ 2018 යන වර්ෂවලදී රු.5,125,803 ක වියදමක් දරා නිමකර තිබුණදත් අවශ්‍ය ගෘහ භාණ්ඩ සපයා ගැනීමට නොහැකිවීම මත 2020 ජනවාරි 20 දින වන විට වසර 05 කට ආසන්න කාලයක සිට නිෂ්කාර්යව තිබුණි. | ආයතනය සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | ඉදිරියේදී මෙම නේවාසිකාගාරයට අවශ්‍ය, අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනිමෙන් පසු සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දීමට පියවර ගනු ලබන බව දන්වා ඇත. |
| (ග) | හෝමාගම පැළෑටි වෛරස් මධ්‍යස්ථානය මඟින් පටක රෝපිත පැළ ලබා ගෙන දැඩි කිරීම සඳහා වර්ග අඩි 1125 (75x15) ප්‍රමාණයේ දැල් ගෘහයක් 2018 සැප්තැම්බර් 03 වන දින රු.366,920 ක වියදමක් දරා වල්පිට ගොවිපළෙහි ඉදිකර තිබුණද එය අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා නොකර 2019 දෙසැම්බර් 05 දින වන විටද නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කළ යුතු වීම. | පටක රෝපිත පැළ සපයා ගැනීමට නොහැකි බැවින්, පැළ දැඩි කිරීම සඳහා එම දැල් ගෘහය භාවිතා නොකරයි. කෙසේ වෙතත්, එම දැල් ගෘහය නිෂ්කාර්යව නොතබා ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා තවානේ අවශ්‍යතා සඳහා ලබා දී ඇති බව දන්වා ඇත. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 සහ 881(1), කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 11 දිනැති දෙපාර්තමේන්තු නියෝග අංක 17/2015 සහ 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ආයතන 09 ක ඇප මුදල් තැබිය යුතු නිලධාරීන් 67 දෙනෙකු විසින් 2019 දෙසැම්බර් 10 දින වන විටත් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි | මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝගප්‍රකාරව අදාළ නිලධාරීන් විසින් ඇප මුදල් තැබිය යුතු වීම. | ඇප මුදල් තැන්පත් කර නොමැති නිලධාරීන්ගේ ඇප මුදල් තැන්පත් කිරීම සඳහා මේ වන විට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. |

## 3.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) එළවළු බීජ මධ්‍යස්ථානයේ 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදනය කරන ලද එළවළු බීජවල පැළවීම දුර්වල වීම මත වටිනාකම රු.38,338,200ක් වූ බීජ ආසන්න වශයෙන් කිලෝග්‍රෑම් 15000 ක් පමණ අපහරණය කළ යුතුව පැවතුණි. | අවශ්‍යතාවය අනුව බීජ නිෂ්පාදනය කිරීම සහ ඒවා නිකුත් කිරීම, බීජ නිෂ්පාදන ඉලක්ක නිවැරදිව පුරෝකථනය කළ යුතු වීම. | අස්වැන්න වැඩි ආනයනික දෙමුහුම් ප්‍රභේදයක් පෞද්ගලික අංශ මඟින් වෙළඳපළ මත හඳුන්වාදීමෙන් දේශීය ප්‍රභේද වෙළඳපළින් ඇත්වීම සිදුවේ. එවැනි කාලවලදී නිෂ්පාදනය කරනු ලබන ඇතැම් බීජ තොග ඉතිරි වීම සිදු වී ඇති බව දන්වා ඇත. |
| (ආ) කන්තලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ක්‍රියාත්මක බීජ වී නිෂ්පාදනයට අදාළව නිෂ්පාදනය කරන ලද හා කොන්ත්‍රාත් බීජ වී නිෂ්පාදනය කිරීමේ වැඩසටහන යටතේ මිලදී ගන්නා ලද බීජ වී කිලෝග්‍රෑම් 846004ක් හෙවත් වී බුසල් 41268 ක් බීජ වී ලෙස නිකුත් කිරීමකින් තොරව පාරිභෝගික වී ලෙස නිකුත් කර තිබුණි. | බීජ වීවල ගුණත්වය රැකෙන පරිදි ගබඩා කිරීම් විධිමත්ව සිදු කළ යුතු වීම. | ගොවිපලේ නිෂ්පාදනය කරනු ලබන සියළුම වර්ග සෑමවිටම විකිණීමට නොහැකි වන අතර, එය එම කන්නයේ ඇති ඉල්ලුම මත රඳා පවතී.බීජ වී අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන, බීජ වීවල ගුණත්වය නිසි ලෙස රැකෙන පරිදි ගබඩා කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙස මවිසින් අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පසුගිය වසර 03 ක කරදියනාරු ගොවිපලේ වී, එළවළු හා අතිරේක ආහාර බෝගවලට අදාළව වගා හානිය රු.4,531,335ක් විය. | වගා හානි අවම කිරීමට කටයුතු කළ යුතු වීම. | නියගය, ගංවතුර, වල්අලි සහ වන සතුන් හේතුවෙන් මෙම හානිය සිදු වී ඇති බව දන්වා ඇත. |
| (ඈ) | කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ රථගාල ඉදිකිරීමට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් අයිතම අංක 09 ප්‍රකාරව මිලිමීටර් 125 ඝනකමින් යුතුව පොළව කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද 2020 ජනවාරි 13 වන දින භෞතික පරීක්ෂා කිරීම අනුව එහි ඝනකම මිලි මීටර් 80 ක් වීම මත කොන්ත්‍රාත්කරුහට ඉටු නොකරන ලද ඝන මීටර් 78.43 ක් වෙනුවෙන් රු.162,350 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව අදාළ කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | එම අයිතමයට සම්පූර්ණ වශයෙන් 75mmලෙස සලකා ගෙවීම් කිරීමටත් ඉතිරි ගෙවීම අයකර ගැනීමටත් තීරණය කර ඇති බව දන්වා ඇත. |

**3.9 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුණ්ඩසාල බීජ නිෂ්පාදන ගොවිපළට ජල පොම්පාගාර පද්ධතිය ඉදිකිරීමේ ඇස්තමේන්තුව ගොඩනැඟිලි සම්මත රේට (BSR) සහ ජාතික ජල සම්පාදන ජල ප්‍රවාහන මණ්ඩලයේ රේටයන් (Water Board Rate) පදනම් කර ගනිමින් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. තවද ඇස්තමේන්තුවෙහි අයිතම අංක 02 හි රේටය රු.5,000 බැගින් මීටර් 150 ක ප්‍රමාණය වෙනුවෙන් ඇස්තමේන්තුගත වටිනාකම රු.750,000 ක් විය යුතු වුවද එය රු.900,000 ක් ලෙස දැක්වීම මත ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරදිව පරීක්ෂා කිරීමෙන් තොරව අනුමැතිය ලබා දී තිබුණි. | සම්මත මිනුම් ක්‍රමයේ මූලධර්මවලට (Standard Measurement of Method) අනුකූලව ප්‍රමාණ බිල්පත් පිළියෙල කළ යුතු අතර ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ රේටයන් අනුව සකස් කරන ලද විශේෂ රේටයන් (SSR) මත මෙම ඇස්තමේන්තුව සකස් කර ගැනීමට අපොහොසත් වී ඇති අතර ඇස්තමේන්තු සකස් කිරීමේ දෝෂය ගණනය කිරීමේදී සිදු වී ඇති ප්‍රමාද දෝෂයක් බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එළවළු බීජ මධ්‍යස්ථානය විසින් 2015 වර්ෂය අවසානයේ පැවති බීජ තොගවලින් පසුගිය වර්ෂ 04 ක කාලය තුළ බීජ වර්ග 10 කට අදාළව නිකුත් කිරීම් සියයට 0 ත් සියයට 36 ත් අතර පරාසයක පැවතුණි. මේ අනුව මෙම බීජ වර්ෂ 05 කට ආසන්න කාලයක් ගබඩා කර තැබීමෙන් ඒවායෙහි ප්‍රරෝහණය දුර්වල වීම මත ප්‍රතික්ෂේප වුවහොත් ආසන්න වශයෙන් අහිමි විය හැකි අලෙවි ආදායමරු.14,629,064 ක් විය. | බීජවල ජීව්‍යතාවය අඩු වීමට පෙර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. | ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා ඇණවුම් ලැබෙන බැවින්, ඒ සඳහා ස්වාරක්ෂක (buffer stock)බීජ තොග තබාගැනීම දෙපාර්තමේන්තුව සතු කාර්යයක් වේ. ඒ සඳහා බීජ නිෂ්පාදනය කර ගබඩා කර තබාගැනීම සිදුකළ යුතු බව දන්වාඇත. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලබන මූලික, අභිජනන, ලියාපදිංචි සහ සම්මත බීජවල ජීව්‍යතාවය ප්‍රශස්ත මට්ටමේ තබා ගනිමින් කොපමණ කාලයක් ශීත ගබඩා තුළ තබා ගත හැකිද යන්න පිළිබඳ පර්යේෂණයන් සිදු කර නොතිබුණි. | පර්යේෂණයන් සිදු කිරීමටකටයුතු කළ යුතු වීම. | මෙම අභිජනන, මූලික හා සම්මත බීජවල ජීව්‍යතාවය ප්‍රශස්ථ මට්ටමින් තබාගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී පර්යේෂණ සිදුකිරීමට අවධානය යොමු කරන බව දන්වා ඇත. |
| (ඈ) | එළවළු බීජ මධ්‍යස්ථානය තුළ වසර 05 ඉක්මවූ මූලික, අභිජනන සහ සම්මත එළවළු බීජ කිලෝ ග්‍රෑම් 16887 ක්ගබඩා කර තිබූ අතර එළවළු බීජ 21 කට අදාළව ලබා ගත් නියැදි තොරතුරු අනුව පසුගිය කාලය තුළ ඒවායෙහි ප්‍රරෝහණ ශක්තිය ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබුණි. මේවායේ ප්‍රරෝහණය සියයට 98 ත් 73 ත් අතර පරාසයක පැවතුණි. මෙම බීජ දිගු කාලීනව ගබඩා කර තැබීමෙන් ඒවායෙහි ප්‍රරෝහණ ශක්තිය දුර්වල වී තිබුණි. | ගුණාත්වයෙන් ඉහළ බීජ ලබා දීමේදී ඒවා හැකි ඉක්මනින් ගොවි ප්‍රජාව වෙත ලබා දීමට කටයුතු කළ යුතු වීම. | බීජ අලෙවියේදී සළකා බලනු ලබන අවම ප්‍රරෝහණ ප්‍රතිශතය 75% ක් නිසා වසරකට වරක් ගනු ලබන "C"වාර්තා නිරීක්ෂණය කරමින් එවැනි බීජ හැකි ඉක්මනින් නිකුත් කිරීමට පියවර ගෙන ඇති බව දන්වා තිබුණි. |
| (ඉ) | එළවළු බීජ මධ්‍යස්ථානය විසින් 2011 වර්ෂයේ සිට 2019 නොවැම්බර් 16 දින දක්වා ණය පදනම මත වටිනාකම රු.1,818,573 ක් වූ බෝග වර්ග 09 කට අදාළව ආසන්න වශයෙන් කිලෝග්‍රෑම් 476 ක් ලබා දි තිබුණද විගණිත දිනය වූ 2019 දෙසැම්බර් 23 දින වන විටද එම මුදල් අයකර ගෙන නොතිබුණි. | හිග මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | සති 02 ක ණය පදනම මත නිකුත් කරනු ලබන බීජ වෙනුවෙන් ලැබිය යුතු මුදල් සෑම වර්ෂයකම මාස 06 කට වරක් අදාළ ආයතන වෙත සිහිකැඳවීම් සිදුකර අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනතෙහි සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා මෙම පනතින් ආවරණය වන ප්‍රදේශ ලෙස දිස්ත්‍රික්ක 10 ක් හඳුනාගෙන තිබුණද සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි විධිවිධාන සංශෝධනය කිරීම 2019 දෙසැම්බර් 02 දින වන විටත් සිදු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි සකස් කරන ලද නව රෙගුලාසි අඩංගු ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලදි.මේ වන විට එය භාෂා ත්‍රිත්වයටම පරිවර්තනය කර අපගේ දෙපාර්තමේන්තුව වෙතින් සිදුවිය යුතු කාර්යය කොටස සම්පූර්ණ කර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව දන්වා ඇත. |
| (උ) | 1996 අංක 24 දරන පස සංරක්ෂණ පනතේ 3(2) වගන්තියට අනුව පත් කරන ලද පාංශු සංරක්ෂණ මණ්ඩලයේ රැස්වීම 2017 සැප්තැම්බර් 28 දිනෙන් පසු පවත්වා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉතා නුදුරේදීම පාංශු සංරක්ෂණ මණ්ඩලය පැවැත්වීම සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඌ) | ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් කාලගුණික මිණුම් මධ්‍යස්ථාන මන්නාරම, මුලතිව් සහ කොළඹ යන දිස්ත්‍රික්ක 03 හි ස්ථාපිත කර නොතිබුණි. | අනෙකුත් දිස්ත්‍රික්ක වලද කාලගුණික මධ්‍යස්ථාන පිහිටුවීමට කටයුතු කළ යුතු වීම. | මෙම දිස්ත්‍රික්කවල කාලගුණික දත්ත අවශ්‍යතා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් සපුරා ගැනීම සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (එ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා කෘෂි කාලගුණ දත්ත රැස්කිරීම, විශ්ලේශණය හා සන්නිවේදනය කිරීමේ අරමුණින් එනම් වර්ෂාපතනය, පාංශු උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සුළගේ වේගය, සුළගේ දිශාව ආදිය මැනීමට කෘෂි කාළගුණ කලාප 46 ක් හඳුනාගෙන ඇතත් ඉන් කලාප 18 ක කෘෂි කාලගුණ මිණුම් ස්ථාපිත කර නොතිබුණි. | කෘෂි කාලගුණික මිනුම් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම. | කෘෂි කාලගුණ ඒකක පිහිටුවා නොමැති කෘෂි පාරිසරික කලාපවල කෘෂි කාලගුණ ඒකක පිහිටුවීම සිදුකරමින් පවතින බව දන්වා ඇත. |
| (ඒ) | කන්තලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් 2019 යල කන්නයේ සිදු කරන ලදකොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩ සටහන යටතේ හෙක්ටයාර් 26 ක නිෂ්පාදනය කළ බීජ වී ප්‍රභේද 03 ක් වගා කළ ප්‍රභේදය මාරු කිරීම හේතුවෙන්ප්‍රතික්ෂේප වී තිබූ බැවින් ආසන්න වශයෙන් බීජ වී බුසල් 5600 ක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | වෙනත් ප්‍රභේද තිබූ ක්ෂේත්‍ර වගාවට යොදා ගැනීම සහ අස්වනු නෙළන යන්ත්‍රය මගින් අස්වනු නෙළීමේදී ද කළවම් වීම සිදු වීම මත බීජ සහතික කිරීමේ සේවය මගින් ප්‍රතික්ෂේප කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | කන්තලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ තොග පරීක්ෂණ වාර්තා අනුව අවස්ථා 12 කදී ප්‍රරෝහණ දුර්වලතාවය, කල් ඉකුත්වීම්, කෘමි හා යාන්ත්‍රික දෝෂ හේතුවෙන් බීජ වී කිලෝග්‍රෑම් 8138ක ප්‍රමාණයක් පාරිභෝගික වී බවට පත් කර තිබුණි. | ගබඩා ඉතා අපිරිසිදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම. | ගබඩාව අලුත්වැඩියාවන් කර, ඉතා හොඳින් පිරිසිදුව නඩත්තු කර ගෙන යනු ලබන බව දන්වා ඇත. |
| (ඕ) | පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ජාන බැංකුවෙහි ජාන ප්ලාස්ම 15806 ක් සංරක්ෂණය කර තිබූ අතර වගා ක්ෂේත්‍රය පටු වීම, පවතින දේශගුණික තත්ත්වය වෙනස්වීම යනාදී කරුණු හේතුවෙන් 2019 ඔක්තෝබර් 25 දින වන විට ලාක්ෂණිකරණයට ලක් කර තිබූ ජාන ප්ලාස්ම සංඛ්‍යාව 6891 ක් හෙවත් සියයට 44 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | ජාන ප්ලාස්මලාක්ෂණිකරණය කිරීම මගින් ආවේණික බෝග හා ශාක හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම අංශය මගින් ජාන සම්පත් ගුණනය කිරීම හා ලාක්ෂණිකරණය යන කරුණු දෙකම සිදුකරන බැවින්, එක් කන්නයකදී ජාන සම්පත් 200 ක් පමණ ලාක්ෂණිකරණය සිදුකරනු ලබයි. වගා ක්ෂේත්‍රය පටුවීම හා කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින්, දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙනත් පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් ජාන සම්පත් ගුණනය කිරීම දැනටමත් සිදුකරනු ලබන බව දන්වා ඇත. |
| (ක) | වසරකට රු.මිලියන 06 ඉක්මවන විදුලි වියදමක් දරන පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ විදුලිය ඇනහිටීමේදී දැරීමට සිදුවන අතිරේක ඉන්ධනවියදම අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම කෙරෙහි 2017 වර්ෂයේදී අවධානය යොමු කර තිබුණද 2019 ඔක්තෝබර් 30 දින වන විටත් එම කාර්යය ඉටු කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතුකළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් මෙම වර්ෂයේදීද විශේෂ වාර්තාවක් සකස් කර පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත යවා ඇති අතර, ලැබෙන ප්‍රතිපාදන මත මෙම කටයුත්ත සිදුකිරීමට අපේක්ෂා කරන බව දන්වා ඇත. |
| (ග) | උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපළක් වශයෙන් පස්යාල ගොවිපළ ස්ථාපිත කර තිබුණද, 2010 වර්ෂයේ රඹුටන් වගාවට අදාළ පර්යේෂණයක් සහ 2015 වර්ෂයේ ගස්ලබු වගාව පිළිබඳ පර්යේෂණයක් ආරම්භ කර පවත්වාගෙන යන අතර පසුගිය වර්ෂ 03ක කාලය තුළ ක්‍රියාවට නංවන ලද පර්යේෂණ සංඛ්‍යාව 03ක් වැනි අවම ප්‍රමාණයක පැවතුණි. | නව පර්යේෂණ සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | මේවන විට නව පර්යේෂණයන් හා වගාවන් සිදු කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ච) | ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සතුව පැවති මධ්‍යම පුස්තකාලය තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය වෙත පවරන අවස්ථාව වන විට ප්‍රධාන පුස්තකාලයාධිපති ලෙස කටයුතු කළ නිලධාරිනිය විසින් පුස්තකාලයේ පොත් භාරදීමේදී පැවති පොත් 96 ක ඌනතාවය සම්බන්ධයෙන් කිසිදු පියවරයක් ගෙන නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චයකර අදාළ අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මධ්‍යම පුස්තකාලයේ පැවති අඩුපාඩු නිවැරදි කරගැනීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. අදාළ පොත්වල ඌනතාවය පිළිබඳව මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව දන්වා ඇත. |
| (ජ) | කුණ්ඩසාලේ පලතුරු ප්‍රභේද සංරක්ෂණය මධ්‍යස්ථානය විසින් මව් ශාක ලෙස හඳුනාගෙන නොතිබූ අඹ, රඹුටන්, ජමනාරං, දොඩම් යනාදී පලතුරු ප්‍රභේද මඟින් ලබා ගනු ලබන රිකිලි බද්ධ කිරීම සිදු කර ඒවා ක්ෂේත්‍රයේ සිටුවීම සහ අලෙවි කිරීම සිදු කර තිබුණි. | බීජ සහතික කිරීමේ සේවයේ ලියාපදිංචි මව් ශාක මඟින් ලබා ගත් රිකිලි යොදා ගෙන බද්ධ කිරීම කළ යුතු වීම. | බීජ සහතික කිරීමේ සේවය මගින් සහතික කිරීමට ඉල්ලීම් කර ඇති බවත් දැනට අධ්‍යක්ෂ (පළතුරු පර්යේෂණ හා සංවර්ධන) ගේ උපදෙස් මත සීමිත පැළ සංඛ්‍යාවක් පමණක් නිෂ්පාදනය කරනු ලබන බව දන්වා ඇත. |
| (ට) | කුණ්ඩසාලේ පලතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානය විසින් 2013 වර්ෂයේ සිට වරින් වර පර්යේෂණ ආයතන හා බාහිර පාර්ශ්වයන් විසින් ලබා දෙන පලතුරු ප්‍රභේද ක්ෂේත්‍රයේ වෙන් වෙන් වශයෙන් සිටුවීම හෝ ලේබල් කිරීමක් සිදු කර නොතිබුණි. | ඕනෑම පුද්ගලයෙකුට පලතුරු ප්‍රභේද පිළිබඳ පහසුවෙන් අවබෝධ කර ගත හැකි වන පරිදි පලතුරු ප්‍රභේද සංරක්ෂණය කිරීමට කටයුතු කළ යුතු වීම. | ලේබල් කිරීමේ කටයුතු සිදුකර ගෙන යමින් පවතින දන්වා ඇත. |
| (ඩ) | කුණ්ඩසාලේ පලතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානයට 2013 වර්ෂයේ සිට 2020 පෙබරවාරි 06 වන දින තෙක් ලැබී තිබූ විවිධ පලතුරු ප්‍රභේදවලට අයත් පලතුරු පැළ 903 ක් වූ අතර ඉන් මැරුණු හා දුර්වල පලතුරු පැළ 196 ක් හෙවත් සියයට 22 ක් විය. එසේ මැරුණු හා දුර්වල පැළ ඉවත් කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවුණි.එම පැළ වෙනුවට ඒවා ලැබුණු ස්ථානවලින් එම ප්‍රභේද ගෙන්වාගෙන සංරක්ෂණය කිරීමට කටයුතු කළ යුතු වුවත් ඒසේසිදු කර නොතිබුණි. | මැරුණු හා දුර්වල පැළ ඉවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හාඑම පැළ වෙනුවට ඒවා ලැබුණු ස්ථානවලින් එම ප්‍රභේද ගෙන්වාගෙන සංරක්ෂණය කිරීමට කටයුතු කළ යුතු වීම. | එලෙස මැරෙන හෝ දුර්වල වන පැල වෙනුවෙන් අදාළ ලියාපදිංචි මව් ශාකවලින් ලබාගෙන ස්ථාපනය කිරීමට මේවන විට වැඩ පිළිවෙලක් යොදා ඇති බව දන්වා ඇත. |
| (ණ) | කුණ්ඩසාලේකෘෂිකර්ම විද්‍යාලය මඟින් NVQ 6 මට්ටමේ පසුගිය වසර 05 ක ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව හා පාඨමාලාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍යයින් පිළිබඳ ප්‍රගතිය පරීක්ෂාවේදී එම පාඨමාලාවේ | කෘෂිකාර්මික ක්ෂේත්‍රයට පිරිපුන් ශිෂ්‍යයින් දායක කර ගැනීමේ හැකියාව වැඩි කර ගැනීමට | මෙම පාඨමාලාව අවසානයේ ස්ථිර වශයෙන්ම රැකියාවක් ලැබේද යන්න නිශ්චිත නොවන බැවින් ශිෂ්‍යයන් විසින් මෙලෙස පාඨමාලාව හැර යාමට හේතු වී |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචි ශිෂ්‍යයින්ට සාපේක්ෂව පාඨමාලාව සම්පූර්ණ නොකළ සිසුන් සංඛ්‍යාව සියයට 7 සිට සියයට 28 දක්වා පරාසයක පැවතුණි. | කටයුතු කළ යුතු වීම. | තිබෙන බව දන්වා ඇත. |
| (ත) | කුණ්ඩසාලේකෘෂිකර්ම විද්‍යාලයේ නේවාසිකාගාරවලින් සහන මිල ගණන් යටතේ කථිකාචාර්යවරුන් සඳහාද ආහාර සැපයීම සිදු කරනු ලබයි. එසේ සපයනු ලබන ආහාරවල සහන මිල ගණන් වර්ෂ 10 කට වඩා වැඩි කාලයකදී සංශෝධනය කර නොතිබුණි. | වෙළඳපළ මිල ගණන්වලට සාපේක්ෂව සහනදායී මිල සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | මිළ ගණන් සංශෝධනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව විසින් අදාළ වාර්තාව ලබා දී ඇති අතර, ඒ අනුව මිළ ගණන් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇත |
| (ද) | කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ නේවාසිකාගාර 04 ක් පාලනයසඳහාකෘෂිකර්මඋපදේශක තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකු පත් කර තිබුණි. මේ හේතුවෙන් එම නිලධාරීන්ට තම විෂය දැනුම වර්ධනය කර ගැනීමට හා ක්ෂේත්‍රය පිළිබඳව දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | වෘත්තීය නිපුණතාවය හා කුසලතාවයන් ඇති නිලධාරීන් හැකි තරම් කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයකින් යුක්තව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. | කෘෂිකර්ම විද්‍යාල සඳහා නේවාසිකාරහාර නිළධාරී තනතුරක් සකස් කර ඊට අදාල බඳවා ගැනීමට කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |
| (න) | කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ නේවාසිකාගාර 04 හි පවතින යටිතල පහසුකම්, සනීපාරක්ෂක සහ මුලුතැන්ගෙහි පහසුකම් ප්‍රමාණවත් නොවන අතර ඒවා නඩත්තුවද නිසිපරිදි සිදු කර නොතිබුණි. | සිසුන් සඳහා ප්‍රමාණවත් යටිතල සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දි ලැබෙන ප්‍රතිපාදන මත අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |
| (ප) | වල්පිට ගොවිපළේ කළමනාකරු විසින් පෞද්ගලික කර්මාන්ත ශාලාවකින් ඉවතලන අපද්‍රව්‍යයක් වනකළුපැහැති කුඩුඅඩංගු මළු 20 ක ප්‍රමාණයක් පොල්වගා භූමියට ගෙනැවිත් දැමීම සඳහා අවසර ලබා දී තිබූ අතර මෙහි එක් මල්ලක බර කි.ග්‍රෑ. 500 ක් පමණ වේ. මේ හේතුවෙන් එම පරිශ්‍රය මෙන්ම බාහිර පරිසරයද අපවිත්‍ර වී තිබුණි. | රාජ්‍ය දේපල ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ වනවිට එවකට රාජකාරියේ යෙදී සිටි ගොවිපළ කළමනාකරු ස්ථාන මාරු යවා ඇති බවත්, ඔහු සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කර ඇති බවත්, ගොවිපල කළමනාකරු විසින් සිදුකර ඇතැයි සඳහන් අක්‍රමිකතා පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ද විමර්ශනයක් සිදුකරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඛ) | විදේශ ශිෂ්‍යත්ව සඳහා විදේශගත වී ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන් 44 දෙනෙකු සම්බන්ධයෙන් රජයට අයවිය යුතු එකතුව රු.30,739,883 ක මුදල් 2020 ජුනි 06 වන දින වන විටද අය කරගෙන නොතිබුණි. | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් 44 දෙනෙකුගේ ශිෂ්‍යත්ව මුදල් අයකරගැනීම සඳහා එකී නිලධරයන්ගේ ලිපින සොයාගත නොහැකි බව සඳහන් කර ඇත. |
| (ම) | ශිෂ්‍යත්ව මුදල් අයකරගැනිමට නොහැකිව් පවතින නිලධාරීන් 05 දෙනෙකුගේ ශිෂ්‍යත්ව වල වටිනාකම රු. 2,445,820 වන නමුත් කාලාවරෝධනය ලක් විම මත රජයට අයවිය යුතු මුදල් අය කර ගැනිමට නිතීමය පියවර ගත නොහැකි තත්ත්වයකට පත් වී තිබුණි. | රජයට අයවිය යුතු මුදල් අය කර ගැනිමට කළමනාකරණයේ දැඩි අවධානය යොමු කළ යුතු වීම. | එම නිලධාරීන්ගේ අයකරගැනීම් සම්බන්ධ නඩු කාලාවරෝධනය වී ඇත්තේ ඔවුන්ගේ ලිපිනයන් සොයාගත නොහැකිවීම හා දණ්ඩන මුදල ගණනය කිරීමට කාලය ගතවීම වැනි නොවැලැක්වීය හැකි හේතු නිසා බව දන්වා ඇත. |
| (ය) | ඇපල් පැළ නිෂ්පාදනයේදී ග්‍රාහක ලෙස යොදා ගනු ලබන මූලාංකුර මඟින් ලබා ගන්නා පැළ ප්‍රමාණය ඉතා අඩු වීම සඳහා විසඳුමක් ලෙස පටක රෝපණ පැළ යොදා ගත්තද, ඒවාද මළකඩ රෝගයට (Rust Disease)ගොදුරු වී විනාශ වී තිබුණි. මෙම රෝගයට විසඳුම් සොයා ගැනීම සඳහා ශාක ව්‍යාධිවේදී අංශවල සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශයන්හි සාමූහික දායකත්වය ලබා දී නොතිබුණි. | නව තාක්ෂණික ක්‍රමවේදයන් මගින් පර්යේෂණ පවත්වා රෝග වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඇපල් නව ප්‍රභේද අත්හදා බැලීමේ පර්යේෂණ මේවන විට ආරම්භකර ඇති බවත්, මලකඩ රෝගයට පාත්‍රවීම අඩු නව ග්‍රාහක ප්‍රභේද වරණයට පර්යේෂණ සිදුකරන බව දන්වා ඇත. |
| (ර) | සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදකයින් වෙත ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකය විසින් තත්ත්ව සහතික 100 ක් පමණ නිකුත් කර තිබුණද සාම්පල් පරීක්ෂා කර බලා පසු කාලීනව මේවාහි තත්ත්වයන් පරීක්ෂා කිරීම සඳහා ආයතනය විසින් පසු විපරම් ක්‍රියාවලියක් හඳුන්වා දී නොතිබුණි. | පසු විපරම් ක්‍රියාවලිය මගින් නිෂ්පාදනයන්වල ගුණත්වය රැක ගැනීමටත් සිදුවිය හැකි අක්‍රමිකතා වළක්වාලීමටත් කටයුතු කළ යුතු වීම. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වශයෙන් පාරිභෝගික සේවා අධිකාරියද හා එක්ව යෝජිත ක්‍රමවේදය කරා යාම සඳහා සහාය විය හැකි බව දන්වා ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) තිරසර සංවර්ධනය අරමුණු 2030 න්‍යාය පත්‍රයට අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිය විෂය පථයට අදාළව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙටුම්පත් කර තිබූ නමුත් 2020 ජූනි 23 දින වන විටත් ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹ නොතිබුණි. | තිරසර සංවර්ධනය අරමුණු හා ඉලක්ක හදුනාගෙන එවා ළගාකර ගැනීමට අවශ්‍ය සැලැසුම් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වීම. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිට විෂය පථයට අදාළව තිරසර සංවර්ධන හා අරමුණු හා ඉලක්ක කෙටුම්පත් කර ඇති බව දන්වා ඇත. |
| (ආ) තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගත යුතු වන්නේ 2030 වන විට බැවින් එක් එක් වර්ෂයේ ඉටු කරගත හැකි ප්‍රමාණයන් පිළිබඳව සැලැසුමක් සකස් කර ඒ අනුව අදාළ ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් එක් එක් වර්ෂය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීමට අදාළව සැලැසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට අදාළව සැලැසුමක් සකස් කළ යුතු වීම. | එක් එක් වර්ෂයේ ඉටු කර ගත හැකි ප්‍රමාණයන් පිළිබඳව සැළසුමක් සකස් කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ සියළුම ආයතනවල දායකත්වය ඇතිව අවශ්‍ය කටයුතු සැලැසුම් කර ඇති බව දන්වා ඇත. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂයට අදාළව සමස්ත දෙපාර්තමේන්තුව ආවරණය වන පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙතසැපයිය යුතු තොරතුරු 2020 ජූනි 30 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සමස්ත දෙපාර්තමේන්තුව ආවරණය වන පරිදි සියලු අධ්‍යක්ෂ අංශ යටතේ සිටින තොරතුරු නිලධාරීන් වෙතින් 2019 වර්ෂයට අදාළ වාර්තා සම්බන්ධයෙන් තොරතුරු කැඳවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උක්ත (අ) ඡේදයේ සඳහන් පනතේ 26 වන වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාවේ හා සම්බන්ධවීමේ විස්තර සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් පිළිබඳ, තොරතුරු නිලධාරීන් සම්බන්ධවීමේ, නම් කළ නිලධාරීන් සම්බන්ධවීමේ විස්තර සහ තොරතුරු ලබා ගැනීම සඳහා අය කරනු ලබන ගාස්තු පිළිබඳ කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක් හෝ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාළ සියලු විස්තර නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරනු ලැබේ. තවද තොරතුරු පනත සම්බන්ධයෙන් වන ඉල්ලුම් කිරීමේ විස්තර හා අයකරනු ලබන ගාස්තු සම්බන්ධ විස්තර ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කර ඇති බව දන්වා ඇත. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | -------------------------------------- |
| (අ) | දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට සේවා අවශ්‍යතා සුදුසු අවස්ථාවේදී හඳුනා ගනිමින් අවශ්‍ය අවස්ථාවේ බඳවා ගැනීම් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 2426 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ තනතුරු 678 ක් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය සඳහා බඳවා ගැනීම් අංක SC(FR)283/2014 දරන නඩුව හේතුවෙන් තාවකාලිකව නවතා ඇත. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරු 325 ක් සහ පර්යේෂණ උප සහකාර තනතුරු 90 ක් පිරවීමට සඳහාමේ දක්වා අනුමැතිය ලැබී නැත. අනෙකුත් බඳවා ගැනීම්වලට අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර මැතිවරණය හේතුවෙන් සියළු බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බව දන්වා ඇත. |
| (ආ) | කුණ්ඩසාලේ පලතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානය ආරම්භ කර වසර 08 ක් ගත වී තිබුණද ආයතනය සඳහා පිරිස්බල තක්සේරුවක් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමැතියට ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි 20 වැනි දින නිකුත් කරන ලද අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පරිපාටික රීති I වැනි කාණ්ඩයේ xviii වන පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන සහ ඒ අනුව සැකසූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති/ කෘෂි පර්යේෂණ/ ඉංජිනේරු) නිලධාරීන්ගේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික සේවා සනවල තනතුරු දරන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ පරිපාටියේ 04 ඡේදය අනුවකටයුතු කළ යුතු වුවද ආයතන 05 කට අයත් නිලධාරීන් 71 දෙනෙකු සහ ඉංජිනේරු අංශයේ සේවාවන්වලට අයත් නිලධාරීන් 15 දෙනෙකු වසර 05 සිට වර්ෂ 31 දක්වා කාලයක් එකම ආයතනයක සේවය කර තිබුණි. | කාර්යපරිපාටික රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අඛණ්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් හිමි ඒකාබද්ධ සේවයේ නොවන සෙසු ප්‍රාථමික සේවා ගණවල නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථානමාරු කිරීම් 2021 වර්ෂයේදී සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයප්‍රකාරව ආයතන 07 කට අයත් නිලධාරීන් 234 දෙනෙකුට වසරකට පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා ලබා දී නොතිබුණි. | චක්‍රලේඛප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ලැබෙන ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන සියළුම නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. |